දේවි බාලිකා විද්‍යාලය - කොළඹ
Devi Balika Vidyalaya - Colombo

පළමු වාර පරීක්ෂණය - 2012
First Term Test - 2012

ඉතිහාසය

11 ශ්‍රේණිය

පැය 1 1/2

නම : ..................................................................

විභාග අංකය : ..................

1 - කොටස

* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01) බ්‍රිතාන්‍යයෝ තම යටත් විජිත පාලනයේදී යොදාගත් උපක්‍රමශීලී පාලන ක්‍රමය වූයේ කුමක්ද ?
1. සෑම ජාතියකටම සාමය කඩ නොකිරීමට උපදෙස් දීමෙනි.
2. බෞද්ධ ඉස්ලාම් හින්දු කතෝලික ආගම් අතර සහජීවනය ඇති කිරීමෙනි
3. කුල භේදය, ආගම් භේදය, ජනවාර්ගික භේදය ඔවුනොවුන් අතර ඇති කරමින් බෙදා පාලනය කිරීමෙනි.
4. බ්‍රිතාන්‍යයේ පැවති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඒ ඒ රටවලට ව්‍යාප්ත කිරීමෙනි.

02) පහත සඳහන් සිදුවීම් වල නිවැරදි ඓතිහාසික අනුපිළිවෙළ දැක්වෙන්නේ කුමන පිළිතුරේද ?
A ද මියුරන් කොමිසම පත්කිරීම
B මහනුවර මගුල් මඩුවේදී රොබට් බ්‍රවුන්රිග් හා රදළ ප්‍රධානීන්ගේ ගිවිසුම
C ධර්මපාල රජු තමාගෙන් පසු තැගි ඔප්පුවකින් පෘතුගීසීන්ට කොට්ටේ රාජධානිය පැවරීම
D මුල්ලේරියා සටනින් පෘතුගීසීන් පරාජයට පත්වීම
E ලොරෙන්සෝද අල්මේදා, ඇතුළු පිරිස ශ්‍රී ලංකාවේ ගාලු වරායට සේන්දු වීම

1. ABECD 2. EDCAB 3. EDACB 4. DABEC

03) - රාජකාරි ක්‍රමය නැවත ඇති කිරීම
- සිවිල් නිලධාරීන්ට සිංහල හා දෙමළ භාෂා ප්‍රවීණතාව ලබා ගැනීමට දිරි ගැන්වීම
- ක්‍රි.ව. 1810 දී අපරාධ නඩු විසඳීම සඳහා ජූරි සභා ක්‍රමය හඳුන්වා දීම
ඉහත සඳහන් ප්‍රකාශ හා සම්බන්ධ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා,
1. සර් ෆ්‍රෙඩ්රික් නෝර්ත්ය 2. සර් තෝමස් මෙට්ලන්ඩ්ය
3. සර් රොබට් බ්‍රවුන්රිග්ය 4. සර් එඩ්වඩ් බාන්ස්ය

04) A ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම B පලාත් බද නියෝජනය
C විධායක කාරක සභා ක්‍රමය D අර්ධ වගකීම් සහිත පාලන ක්‍රමය
E සිවිල් සේවය සංශෝධනය කිරීම
ඉහත දැක්වූ කරුණු අතරින් කෝල්බෲක් යෝජනා ඇතුලත් පිළිතුර තෝරන්න.
1. C / E 2. A / C 3. B / D 4. A / E

05) කුඩා පොල හිමි, ගොංගාලේ ගොඩ බණ්ඩා, වීර පුරන් අප්පු, යන දේශීය නායකයින්ගේ මැදිහත් වීමෙන් විරෝධාර අරගලයක් ආරම්භ කිරීමට ප්‍රධානම හේතුව වූයේ,

1. රාජකාරි ක්‍රමය අවලංගු කිරීම
2. අධිකරණ ප්‍රතිසංස්කරණ ඇති කිරීම
3. ජනතාවට අසාධාරන බදු පැනවීම
4. ආණ්ඩුවේ නිලධාරීන්ගේ ආරක්ෂාව බව

06) ගැමියන්ට සුළු ආරවුලකට පවා නගරයේ පැවති උසාවි කරා ගොස් නීතිඥ ගාස්තු, මුද්දර ගාස්තු, මග වියදම් දරා කරදර රාශියකට මුහුණ පෑමට එකල සිදුවිය.
මෙම කියමනට වඩාත් ගැලපෙන්නේ පහත සඳහන් කුමන ආන්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයද ?

1. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
2. මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
3. කොල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
4. මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

07) ලංකා වැවිලි ක්ෂේත්‍රයේ ජෝර්ජ් බර්ඩ් ට හිමිවන්නේ වැදගත් ස්ථානයකි. ඒ පහත සඳහන් කුමන කරුණක් පදනම් කරගෙනද ?

1. ප්‍රථම වරට ක්‍රි.ව. 1825 අගලවත්ත ලක්පදුර ප්‍රදේශයේ රබර් වගාව ඇරඹීම නිසාය.
2. ප්‍රථම වරට ක්‍රි.ව. 1822 ගම්පොළ සිංහ පිටියේ කෝපි වත්තක් ඇරඹීම නිසාය.
3. ප්‍රථම වරට ක්‍රි.ව. 1828 කුරුණෑගල පොල්වත්තක් ඇරඹීම නිසාය.
4. ප්‍රථම වරට ක්‍රි.ව. 1823 නුවරඑළියේ තේ වත්තක් ඇරඹීම නිසාය

08) 20 වන සියවසේ මුල් දශක වලදී මෙරට නිදහස් ව්‍යාපාරයේ මූලිකත්වය ගත් මධ්‍යම පන්තිය අනුගමනය කළ ක්‍රියාමාර්ග කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ මින් කුමක්ද ?

1. උඩරට හා පහත රට සඳහා වෙන් වෙන් ව පාලන ක්‍රම ඉල්ලා සිටීම
2. පාලක පක්ෂයට විරුද්ධව සන්නද්ධ අරගලයක් ඇරඹීම
3. දේශපාලන නිදහස ලබාගැනීම සඳහා සාමූහිකව කටයුතු කිරීම
4. තම කටයුතු සඳහා ජන වාර්ගික විෂමතා යොදා ගැනීම

09) ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම විකාශනය පිළිබඳ අවස්ථා කීපයක් පහත දැක්වේ. ඒවා බිහිවීමේ නිවැරදි අනුපිළිවෙල දැක්වෙන්නේ කිනම පිළිතුරේද ?

1. විධායක කාරක සභා , සෙනෙට් සභාව , ද්විත්ව පාලනය , ජාතික රාජ්‍ය සභාව
2. ද්විත්ව පාලනය , විධායක කාරක සභා , සෙනෙට් සභාව , ජාතික රාජ්‍ය සභාව
3. ද්විත්ව පාලනය , සෙනෙට් සභාව , ජාතික රාජ්‍ය සභාව , විධායක කාරක සභාව
4. ජාතික රාජ්‍ය සභාව , ද්විත්ව පාලනය , විධායක කාරක සබා , සෙනෙට් සභාව

10) ශ්‍රී ලංකාවේ සංස්කෘතිය හා සභ්‍යත්වය කෙරෙහි දීර්ඝ කාලයක් තුලදී දැඩි බලපෑමක් ඇති කිරීමට සමත් වූ ඓතිහාසික සිද්ධිය මින් කුමක්ද ?

1. බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාව යටත් කර ගැනීම
2. කාලිංග මාඝ ශ්‍රී ලංකාව ආක්‍රමණය කිරීම
3. පෘතුගීසීන් ශ්‍රී ලංකාව ආක්‍රමණය කිරීම
4. මිහිඳු හිමියන් විසින් බුද්ධදහම මෙරටට ගෙන ඒම

11) ග්‍රාමීය සුභ සාධනයට පුරෝගාමී මෙහෙයක් ඉටුකළ 'ගම් සභාව' අක්‍රීය වීම සිදුවූයේ කවර ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් යටතේද ?

1. ඩොනමෝර්
2. මැකලම්
3. මැනිං
4. කෝල්බෲක් කැමරන්

12) A රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම

B විධායක කාරක සභා ක්‍රමය ඇරඹීම

C ජනවාර්ගික නියෝජනය අහෝසි කිරීම

ඉහත සඳහන් යෝජනා ක්‍රියාත්මක වූයේ කවර ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේද ?

1. කෝල්බෲක් - කැමරන්
2. කෲව් - මැකලම්
3. මැනිං - ඩෙවොන්ෂයර්
4. ඩොනමෝර්

13) බ්‍රිතාන්‍ය පාලන සමයේදී ලංකාවේ සමාජ ආර්ථික රටාවේ වෙනස් කම් ඇති කිරීමට මුල් වූ ආණ්ඩුකාරවරුන් කිහිප දෙනෙකුගේ නම් X තීරුවේ ද ඔවුන් විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග කිහිපයක් Y තීරුවේද දැක්වේ.

| **X** | | **Y** |
|---|---|---|
| 1. එඩ්වඩ් බාන්ස් | A | දුම්රිය මාර්ග ඉදිකිරීම |
| 2. හෙන්රි වෝඩ් | B | වාරි මාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීම |
| 3. වෙස්ට් රිජ්වේ | C | රාජකාරි ක්‍රමය අවලංගු කිරීම |
| | D | මහා මාර්ග ඉදිකිරීම |

X තීරුවේ අනුපිළිවෙල අනුව Y තීරුවේ ඇති ක්‍රියාමාර්ග ගැළපූ විට දැක්වෙන නිවැරදි පිළිතුර කුමක්ද ?

1. ACB
2. BCD
3. DCA
4. DAB

14) ලංකාවේ උතුරු ප්‍රදේශයේ ඉතාමත් සංවිධානාත්මක මිෂනාරී අධ්‍යාපන ක්‍රමයක් ගොඩනගන ලද්දේ පහත සඳහන් කවර මිෂනාරී සමාගමක් විසින්ද ?

1. ලන්ඩන් මිෂනාරී සමාගම
2. වෙස්ලියන් - මෙතෝදිස්ත මිෂනාරී සමාගම
3. ඇමරිකන් මිෂනාරී සමාගම
4. බැප්ටිස්ට් මිෂනාරී සමාගම

15) වර්ෂ 1898 දී තරුණ බෞද්ධ සංගමය පිහිටුවීමෙහිලා පුරෝගාමී වූ පුද්ගලයා වන්නේ,

1. අනගාරික ධර්මපාලතුමාය
2. වලිසිංහ හරිස්චන්ද්‍රතුමාය
3. සර් ඩී.බී. ජයතිලක මැතිතුමාය
4. පියදාස සිරිසේන මැතිතුමාය

16) අධ්‍යාපන කටයුතුවල දියුණුව උදෙසා සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් නොවන්නේ,

1. බාලාංශයේ සිට විශ්ව විද්‍යාලය දක්වා නොමිලයේ අධ්‍යාපනය ලබාදීම
2. අධ්‍යාපන පරිපාලන කටයුතු සඳහා ප්‍රසිද්ධ ඉගැන්වීම් දෙපාර්තමේන්තුවක් පිහිටුවීම
3. පාසල් සිසුන් සඳහා දිවා ආහාර වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරිම
4. පාසල් විෂයමාලාව තුල ආගම අනිවාර්ය විෂයක් බවට පත් කිරීම.

17) ඉංග්‍රීසීන් විසින් ලංකාවේ ඇති කළ ද්විත්ව පාලන ක්‍රමය ලෙස දැක්වෙන්නේ,

1. ලංකා රාජ්‍ය, බ්‍රිතාන්‍ය රාජ්‍ය සමග එකතු වී ලංකාව පාලනය කිරීම
2. බ්‍රිතාන්‍ය ජාතිකයන් හා ලන්දේසී ජාතිකයන්ගෙන් එකතුවෙන් ඇති කල පාලන ක්‍රමයයි.
3. ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගම හා බ්‍රිතාන්‍ය ආණ්ඩුව හවුලේ රට පාලනය කිරීමයි
4. පෘතුගීසී ජාතිකයන් හා ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගම සම්බන්ධ වී කල පාලනයයි.

18) ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනයට විරුද්ධව ඇති වූ කැරලි පිළිවෙලින් සඳහන් කල විට නිවැරදි පිළිතුර වන්නේ,

1. 1797 , 1818 , 1848
2. 1796 , 1815 , 1848
3. 1797 , 1818 , 1915
4. 1797 , 1848 , 1915

19) ක්‍රි.ව. 1796 න් පසුව ඉංග්‍රීසීන් උඩරට රාජධානිය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට හේතුව කුමක්දැයි තෝරන්න.

1. උඩරට වෙළඳ ද්‍රව්‍ය ලබා ගැනීමේ අපේක්ෂාව
2. උඩරට ජනතාව හා රජු සමග සම්බන්ධතා පැවැත්වීමේ උවමනාව
3. රටමැද ස්වාධීන රාජ්‍යයක් පැවතීම වාසිදායක වීම
4. කොළඹ හා ත්‍රිකුණාමලය අතර සම්බන්ධතා පැවැත්වීමට උඩරට රාජ්‍ය බාධාවක් වීම.

20) බ්‍රිතාන්‍යයන්ට ඉන්දියාවේ තම බලය ආරක්ෂා කර ගැනීමට ත්‍රිකුණාමල වරාය වැදගත් වූයේ

1. ත්‍රිකුණාමලය ස්වභාවික වරායක් වූ නිසාය
2. ඉන්දියාවට දකුණින් පිහිටා තිබීම නිසාය
3. ඉන්දියාවේ නැගෙනහිර වෙරළේ නාවික බලය මෙහි සිට පාලනය කල හැකි වූ නිසාය
4. ඉන්දියාවට මුහුණලා පිහිටා තිබීම නිසාය

## 2 - කොටස

* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01) සපයා ඇති ලෝක සිතියමෙහි පහත සඳහන් ස්ථාන ලකුනු කර නම් කරන්න.

කැලිකට්, ලිස්බන්, මලබාර් වෙරළ , පර්සියාන් බොක්ක , වෙනිසිය , කොන්ස්තන්තිනෝපල්, සින්දු ගග, ජකර්තා , බයිබර් , ලාටරට

02) සපයා ඇති ලංකා සිතියමෙහි පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.

ධූමරක්ත පබ්බත , ගොඩවාය , ලංකාපුර , දේවනගර , ගාල්ල , කප්පරකන්ද නදී , කල් පිටිය , සුබරතිත්ථ , නාච්චදූව වැව, කිතුල්ගල බෙලි ලෙන

03)
1. ක්‍රි.ව. 1818 නිදහස් සටනට තුඩුදුන් හේතු 2 ක් ලියන්න.
2. ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ 4 ක් පැහැදිලි කරන්න.
3. සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ ද්විමණ්ඩල පාර්ලිමේන්තුව යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

04)
1. බෞද්ධ ආගමික ප්‍රබෝධයක් ඇති කිරීමට පුරෝගාමී වූ නාහිමිවරුන් දෙදෙනෙකු නම් කරන්න.
2. සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මැතිතුමාගෙන් අධ්‍යාපනයට සිදුවූ සේවය කෙටියෙන් පැහැදිලි කරන්න.
3. ක්‍රි.ව. 1915 සිංහල මුස්ලිම් කෝලාහලයට හේතු සහ එහි ප්‍රතිඵල දක්වන්න.